www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එල්ටීටීඊ නායකයාගේ කතාව ශ්‍රී ලංකාවේ යුද්ධය යලි ඇවිලීමේ අන්තරාය පෙන්නුම් කරයි

## LTTE leader’s speech points to danger of renewed war in Sri Lanka

**කේ. රත්නායක විසිනි**
**2004 දෙසැම්බර් 3**

නොවැම්බර් 27 දා දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) නායක වී. ප්‍රභාකරන් සිදු කල වාර්ෂික “මහා වීර දින” කතාව, ශ්‍රී ලංකාව යලි සිවිල් යුද්ධය කරා ලුහුටා යන බව පෙන්නුම් කරන තවත් එක් දර්ශකයකි. ප්‍රභාකරන් දැක්වූ අදහස් අවධානයට යොමු කිරීමට වටින්නේ බොහෝ සෙයින් ඒවායේ යුදකාමී බව නිසා නොව, ඒවායේ මංමුලා සහගත ස්වභාවයත් හිර වී ඇති සාම සාකච්ඡා යලි අරඹන ලෙස “ජාත්‍යන්තර ප්‍රජාවට” කරන ධ්වජභංග ආයාචනාත් හේතු කොට ගෙන ය.

මෙවර මහා වීර දිනය වනාහි 2002 පෙබරවාරියේ දී එල්ටීටීඊය එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුව පැවති තෙවැන්න යි. කෙසේ වෙතත්, ප්‍රභාකරන් සිය කතාවේ දී සඳහන් කල පරිදි, ඊනියා සාම ක්‍රියාදාමයෙන් එල්ටීටීඊයට කිසිවක් ලැබී නැත. දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත්වල දෙමල ඊලම් නමින් වෙනම රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ සිය ඉල්ලීම එය ආකාරගතව අතහැර දැමූ නමුදු, එයට හිලව් වසයෙන් පොරොන්දු වූ කොලඹ ආන්ඩුව සමග බලය බෙදා ගැනීමේ අවසන් සම්මුතියක් සම්බන්ධ සාකච්ඡා ආරම්භ කෙරී වත් නැත.

එල්ටීටීඊය මුහුන දී සිටින උභතෝකෝටික තත්වය සම්පින්ඩනය කරමින් ප්‍රභාකරන් මෙසේ ප්‍රකාශ කලේ ය: “අන්තර් වාර විසඳුමකින් හෝ නිත්‍ය විසඳුමකින් තොරව, ස්ථාවර සාමයකින් තොරව සහ කිසිදු අස්වැසිල්ලකින් තොරව, දේශපාලන රික්තයක් තුල අපට දිගට ම සිර වී සිටිය නො හැකි ය.... නිදහසකින් තොරව, විමුක්තියකින් තොරව, අනාගතය පිලිබඳව කිසිදු බලාපොරොත්තුවකින් තොරව, දේශපාලන අවිනිශ්චිත භාවයේ ගන දුර තුල අපට දිගට ම සිටිය නො හැකි ය. ඉවසීමට හා බලාපොරොත්තුවලට සීමා රේඛා පවතී. අපි දැන් එම සීමා රේඛා වෙත ලඟා වී ඇත්තෙමු.”

උතුරු හා නැගෙනහිර පලාත්වලට අන්තර් ස්වයං-පාලන අධිකාරියක් (අයිඑස්ජීඒ) පිලිබඳ සිය යෝජනා මත පදනම්ව සාකච්ඡා යලි අරඹන ලෙස එල්ටීටීඊ නායකයා ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගට හා ඇගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුවට ආයාචනා කලේ ය. ඔහු සිය කතාව අවසන් කලේ යලි සන්නද්ධ ගැටුමක් කරා යන බවට කල තර්ජනාත්මක ඉඟියකින් සහ “අප මුහුන දී සිටින දුෂ්කර තතු අවබෝධ කර ගන්නා ලෙසත් අපගේ සාධාරන හා යුක්තියුක්ත ආස්ථානය මත පදනම්ව සාම සාකච්ඡා යලි ඇරඹීමට ශ්‍රී ලංකා ආන්ඩුව පොලඹවන ලෙසත්, උත්සුක ජාත්‍යන්තර ආන්ඩුවලට” කල ආයාචනයකිනි.

මෙම ප්‍රකාශ සම වන්නේ සිය දේශපාලන බංකොලොත්කම පිලිගැනීමකට ය. මීට තෙවසරකට පෙර එල්ටීටීඊය සටන් විරාම ගිවිසුම අත්සන් කරන විට පුරසාරම් දෙඩුවේ සාකච්ඡා මේසයට ඒමට කොලඹ ආන්ඩුවට බල කරනු පිනිස මහ බලවතුන්ගේ සහයෝගය දිනා ගැනීමට තමන් සමත් වූ බවට යි. එහි ඉදිරිදර්ශනය වූයේ උතුරු හා නැගෙනහිර පලාත් ජාත්‍යන්තර ප්‍රාග්ධනය ඇද ගන්නා ආකර්ෂනීය ධ්‍රැවයක් බවට පත් කර ගැනීමට දෙමල පාලක ප්‍රභූවට ඉඩ සලසන බලය බෙදා ගැනීමේ සැකැස්මකි. ශ්‍රී ලංකාව “ව්‍යාඝ්‍ර ආර්ථිකයක්” බවට පරිවර්තනය කිරීමට එල්ටීටීඊය සහයෝගය දෙන බවට 2002 පැවති ආරම්භක සාකච්ඡා වටයේ දී එල්ටීටීඊ ප්‍රධාන සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් පුරසාරම් දෙඩී ය.

කෙසේ වෙතත්, අධිරාජ්‍ය බලවතුන් සම්බන්ධයෙන් සලකන තාක් දුරට, මොන යම් හෝ සාම ගිවිසුමක කොටසක් ලෙස එල්ටීටීඊය පිලිගනු ලැබෙන්නේ එය යටහත් ක්‍රියාකලාපයක් භාර ගෙන එයින් ඉල්ලා සිටින සියලු කොන්දේසි ඉටු කරන්නේ නම් පමනි. බුෂ් පාලනාධිකාරය විශේෂයෙන් ම එල්ටීටීඊය “ප්‍රචන්ඩ ක්‍රියා ප්‍රතික්ෂේප” කල යුතු යයි අවධාරනය කල අතර එය “ත්‍රස්තවාදී සංවිධානයක්” ලෙස දිගට ම හංවඩු ගැසී ය. මෙය වනාහි වොෂිංටනයේ “ත්‍රස්තවාදයට එරෙහි භූගෝලීය යුද්ධයේ” සන්දර්භය තුල පැහැදිලි තර්ජනයන් අත්පත් කර ගත් පියවරකි.

ශ්‍රී ලංකා මිලිටරිය මුහුදේ දී සිදු කල ප්‍රකෝපකරනයන් මාලාවකට ද ප්‍රාථමික කාරනා සම්බන්ධයෙන් මොන යම් හෝ සීමිත ප්‍රගතියක් වත් අත්පත් කර ගැනීමට අපොහොසත් වීමෙන් ද පසුව එල්ටීටීඊය 2003 අප්‍රේල් මස සාකච්ඡාවලින් ඉවත් විය.

සාකච්ඡා යලි ඇරඹීමට මිලක් වසයෙන්, උතුරු හා නැගෙනහිර පලාත්වල සිය ආධිපත්‍යය යටතේ අන්තර් පාලනයක් පිහිටුවිය යුතු යයි ඉල්ලා සිටි එල්ටීටීඊය, එජාපෙ ආන්ඩුව සමග පැවති දිග්ගැසුනු අදහස් හුවමාරුවකින් පසුව පසුගිය නොවැම්බරයේ දී සිය අයිඑස්ජීඒ සැලසුම් ඉදිරිපත් කලේ ය.

කෙසේ වෙතත්, මිලිටරිය ද ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සිංහල ස්වොත්තමවාදී කන්ඩායම් ද සමග එක්ව සාම ක්‍රියාදාමයට එරෙහිව උද්ඝෝෂනය කරමින් සිටි ජනාධිපති කුමාරතුංග, එල්ටීටීඊ යෝජනා ඉදිරිපත් වීමෙන් දින කිහිපයක් ඇතුලත මූලික අමාත්‍යංශ තුනක පාලනය සියතට ගෙන හදිසි නීතිය පැනවීමට ද පියවර ගත්තා ය. දිග්ගැසුනු දේශපාලන හිරවීම අවසන් කෙරුනේ අප්‍රේල් මහ මැතිවරනයට පාර කපමින් ඇය අවසානයේ පෙබරවාරියේ දී එජාපෙ ආන්ඩුව බලයෙන් පහ කිරීමෙනි. ඇගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ජවිපෙ සමග සන්ධානගතව එම මැතිවරනය ජය ගති.

නව එජනිස ආන්ඩුව ද බලයෙන් පහ කෙරුනු එජාපෙ මුහුන දුන් උභතෝකෝටිකයට ම මුහුන දුනි. එක අතකින්, යලි යුද්ධය කරා යාමක්, දිවයින ලාභ ශ්‍රම වේදිකාවක් බවට පත් කර ගැනීමේ ව්‍යාපාරික ප්‍රභූවේ සැලසුම් සම්බන්ධයෙන් ගත් කල, ආර්ථිකව ව්‍යසනකාරී වනු ඇත. අනෙක් අතට, එල්ටීටීඊයට කිසියම් හෝ සහනයක් දීම, ශ්‍රී ලංකා රාජ්‍යය 1948 සිය ආරම්භයේ පටන් මේ වන තෙක් රදා පවත්නා අත්තිවාරම වන සිංහල ස්වෝත්තමවාදී දෘෂ්ටිවාදයට වල කැපීමේ තර්ජනය මතු කරයි.

ප්‍රතිඵලය වී ඇත්තේ භයංකර හිරවීමකි. අයිඑස්ජීඒ මත පාදකව සාකච්ඡා සිදු කල හොත් තමන් පාලක එජනිසයෙන් කැඩෙන බවට ජවිපෙ අනතුරු අඟවා තිබේ. අයිඑස්ජීඒ සාකච්ඡා සඳහා පදනම නො වේ නම් එල්ටීටීඊය සාකච්ඡා ඇරඹීම ප්‍රතික්ෂේප කර ඇත. මෙම ගැටලුව විසඳීමට නෝර්වේජියානු අතරමැදියන් දැරූ සියලු ප්‍රයත්නයන් අසාර්ථක වී තිබේ.

සෙනසුරාදා කල සිය කතාව තුල දී, එල්ටීටීඊය සාකච්ඡාවලට කැප වී ඇති බවටත් "බාධාව ලෙස පවතින්නේ" කොලඹ ආන්ඩුව බවටත් රැස්ව සිටි පිරිස නො ව "ජාත්‍යන්තර ප්‍රජාව" ඒත්තු ගැන්වීමට ප්‍රභාකරන් සැලකිය යුතු ප්‍රයත්නයක් දැරී ය. "දෙමල ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රතිවිරෝධී සහ අන්‍යොන්‍ය වසයෙන් පරස්පර විරෝධී අදහස් හා පිලිවෙත් ප්‍රකාශ කරන එකිනෙකාට නොගැලපෙන පක්ෂවලින් යුත් අශුද්ධ සන්ධානයක්" ලෙස ඔහු ආන්ඩුව හංවඩු ගැසී ය.

## එල්ටීටීඊය තුල ආතතීන්

එල්ටීටීඊයේ අසහනය ඔවුන්ගේ ම සංවිධානය මත ක්‍රියාත්මක වන තියුනු පීඩනයන් සමග බැදී පවතී. දෙමල ජනතාවගේ සමාජ අවශ්‍යතා සහ ප්‍රජාතන්ත්‍ර අභිලාෂයන් සන්තර්පනය කිරීමෙහි ලා මුලුමනින් ම අපොහොසත් වී ඇති මෙම සංවිධානය භේදයන්ගෙන් ඉරිතලා ගොස් ඇත. මේ වසර මුල දී, කරුනා නමින් වඩා ප්‍රසිද්ධ එල්ටීටීඊයේ නැගෙනහිර මිලිටරි අන දෙන නිලධාරි වී. මුරලිදරන්, "උතුරේ" නායකයන් ඒකාධිකාරී ලෙස වරප්‍රසාද භුක්ති විඳින බවටත් නැගෙනහිර අවශ්‍යතා නොතකා හරින බවටත් චෝදනා කරමින් සංවිධානයෙන් බිඳී වෙන් විය. එල්ටීටීඊය වහාම මැදිහත් වී ප්‍රහාර එල්ල කොට කැරලිකාර කන්ඩායම විසුරුවා හැරි නමුත් කන්ඩායම් දෙක අතර කටුක බල අරගලයක් දිගට ම පවතී.

එල්ටීටීඊය සිය අධිකාරියට ඉතාමත් අවශ්‍ය මුක්කුවක් සම්පාදනය කරගනු පිනිස අයිඑස්ජීඒ යෝජනා ක්‍රියාවට දැමීම සඳහා මංමුලා සහගතව සිටී. "අපගේ යෝජනාවල සමහර කොටස් ගැටලු සහගත හෝ මතභේදයට තුඩු දෙන්නේ නම්, . . . එම ගැටලු සාකච්ඡා මේසයේ පැවැත්වෙන සාකච්ඡා මගින් විසඳා ගත හැකි ය" යැයි ප්‍රභාකරන් සිය කතාවේ දී බැගෑපත් විය. අයිඑස්ජීඒ යෝජනාවල විධිවිධාන යටතේ, නැගෙනහිර හා උතුරු පලාත් මත ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස පටවනු ලබන පරිපාලනයක වැඩි වාසි සහගත තත්වයක් එල්ටීටීඊයට නිකම්ම ලැබෙනු ඇත. එමෙන් ම අයිඑස්ජීඒ යටතේ මෙම ප්‍රදේශවලට ලැබෙන විදේශ ආධාර ඉහල යාමටත් ඒ සම්බන්ධයෙන් එල්ටීටීඊයට සැලකිය යුතු බලතල හිමි වීමටත් නියමිත ය.

කෙසේ වෙතත්, ප්‍රභාකරන්ට "ජාත්‍යන්තර ප්‍රජාවෙන්" කිසිදු සහායක් නො ලැබෙනු ඇත. මහා වීර දින කතාවට යන්තම් දින දහයකට පෙර, නිවේදනයක් නිකුත් කල එක්සත් ජනපද නියෝජ්‍ය රාජ්‍ය ලේකම් රිචඩ් ආර්මිටේජ්, "එක්සත් ශ්‍රී ලංකාවක රාමුව තුල සාම ක්‍රියාදාමයේ ප්‍රමුඛ ගැටලු නිරාකරනය කර ගැනීමෙහි ලා ඇයගේ කැප වීමෙහි පවත්නා ස්ථිරසාර හා ඍජු භාවය" සම්බන්ධයෙන් ජනාධිපති කුමාරතුංග ප්‍රශංසාවට ලක් කලේ ය. එල්ටීටීඊය "වචනයෙන් හා ක්‍රියාවෙන් ත්‍රස්තවාදය අතහැර සාම සාකච්ඡා මේසයට යලි පැමිනිය" යුතු යයි ඔහු නැවත වතාවක් කෙලින් ම අවධාරනය කලේ ය.

තමන් අයිඑස්ජීඒ පිලි නොගන්නා බව ඉන්දියාව දැනටමත් පැහැදිලි කර ඇත. එපමනක් නොව, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ට ද්‍රව්‍යමය හා සේවා ආධාර ද පුහුනුව ද සම්පාදනය කරන එල්ටීටීඊයට එරෙහිව සටන් වැදීමේ එහි හැකියාව ඇවැන්ත පරිමානව ඉහල දමන වඩා දුර දිග යන ආරක්ෂක ගිවිසුමක් කොලඹ ආන්ඩුව සමග ඇති කර ගැනීමේ ක්‍රියාදාමයක නව දිල්ලිය නිමග්නව සිටී. එක්සත් ජනපද මිලිටරිය ද ශ්‍රී ලංකා මිලිටරිය සමග වඩා සමීප සබඳතා වර්ධනය කර ගැනීමේ යෙදී සිටී.

එල්ටීටීඊය මුහුන දී සිටින්නේ ඉතා අසීරු උභතෝකෝටිකයකට ය. යම් හෙයකින් යලි සන්නද්ධ ගැටුම් ඇවිලුන හොත් එය මුහුන දෙන්නේ එක්සත් ජනපදයේ හා ඉන්දියාවේ සහාය ලබන ශ්‍රී ලංකා මිලිටරියකට ය. අනෙක් අතට සාකච්ඡා යලි අරඹුන

පිනිස එය කොලඹ ආන්ඩුවට සහන දුන හොත්, දෙමල සුලුතරය අතර සිය පදනම්වලට තව දුරටත් වල කැපෙන සහ තමන්ගේ ම සංවිධානය තුල ආතතීන් උත්සන්න වන තත්වයකට එල්ටීටීඊය මුහුන දෙනු ඇත.

තව ද, මහා වීර දින රැලිය ආසන්න වෙද්දී පැවතුනු තියුනු ගැටුම් මගින් පැහැදිලි වන්නේ වත්මන් අවිනිශ්චිත තත්වය — සාමයත් නොවන යුද්ධයත් නොවන තත්වය — පවත්වා ගෙන යාම වඩ වඩාත් අසීරු වන බව යි. එල්ටීටීඊය දැනටමත් කරුනා කන්ඩායම සමග තියුනු වන ගැටුමක නිමග්නව සිටින අතර ම, ශ්‍රී ලංකා මිලිටරිය හා ජවිපෙ වැනි සිංහල ස්වෝත්තමවාදී සංවිධාන අවුලුවන ප්‍රකෝපකරනයන්ට ද මුහුන දෙයි.

"නොවැම්බර් 19 දා යාපන නගරයට උතුරෙන් පිහිටි වැල්වෙටිතුරෙයිහි දී දෙමල තරුනයන් දෙදෙනෙක් වෙඩි තබා ඝාතනය කෙරුනි. එල්ටීටීඊය ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මිලිටරියට චෝදනා කලේ ය. පසු දින යාපන අර්ධද්වීපයේ ප්‍රදේශ ගනනාවක ම මාර්ග හරස් කරමින් සහ ටයර් පුලුස්සමින් පැවැත්වුනු විරෝධතා පැන නැගුනි. එහි දී ගැටුම් ගනනාවක් ම හට ගත් අතර එක් අවස්ථාවක දී පොලීස් භටයන් හා සොල්දාදුවන් එක් රැස් වූ ජන පිරිසකට වෙඩි තැබීමෙන් එක් අයෙකුට තුවාල සිදු විය.

"නොවැම්බර් 24 දා මඩකලපුවේ වන්තාරුමූලෙයිහි දී මහා වීර දින උත්සව වෙනුවෙන් සැරසිලි කරමින් සිටි දෙදෙනෙක් වෙඩි තබා ඝාතනය කෙරුනි. එය කරුනා කන්ඩායමේ වැඩක් යයි විශ්වාස කෙරේ. පසු දින, නොවැම්බර් 25 දා නැගෙනහිර පලාතේ අක්කරෙයිපත්තුහි දී එල්ටීටීඊ සාමාජිකයකු වන උමාකාන්ත් වෙඩි තබා ඝාතනය කෙරුනි.

"නොවැම්බර් 25 දා, මන්නාරමේ මහා වීර දින උත්සවවල කොටසක් ලෙස එල්ටීටීඊ ධජය එසවීමේ යෙදී සිටි එල්ටීටීඊ සාමාජිකයන් හා ආධාරකරුවන් වලකාලීමට හමුදා භටයෝ උත්සාහ කලහ. සොල්දාදුවන් පාර්ලිමේන්තු මන්ත්‍රී විනෝ නොහාරතලිංගම් ඇතුලු රැස්ව සිටි නිරායුධ සෙනගට පොලු මුගුරුවලින් පහර දීමෙන් 14 දෙනෙකුට තුවාල සිදු විය. එදින ම වවුනියාවේ දී එවැනි ම සිද්ධියක් ඇති වූ අතර එහි දී හමුදාව එල්ටීටීඊ ධජය එසවීමේ යෙදී සිටි පිරිසකට වෙඩි තැබීමෙන් හය දෙනෙක් තුවාල ලැබී ය.

"නොවැම්බර් 26 දා, ත්‍රිකුනාමලයේ දී හින්දු සංස්කෘතික ශාලාවක ඔසවා තිබූ එල්ටීටීඊ ධජයක් පහත හෙලන ලෙස ඉල්ලමින් ජවිපෙ ප්‍රකෝපකාරී විරෝධතාවක් පැවැත්වී ය. ජවිපෙ මන්ත්‍රී ජයන්ත විජේසේකර 300ක පිරිසක් සමග ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවේ කාර්යාලයටත් ඉන් පසුව හින්දු සංස්කෘතික ශාලාවටත් පෙලපාලියෙන් ගිය අතර මග දී පොලීසිය කඳුලු ගෑස් ගසා පිරිස විසුරුවා හැරියේ ය. සඳුදා එල්ටීටීඊයට හිතැති දෙමල සංවිධානයක් එම පෙලපාලියට එරෙහි විරෝධතාවක් සංවිධානය කල විට වාර්ගික ගැටුම් ඇවුලුනි. එහි දී සිංහල වැසියන් තිදෙනෙක් මරනයට පත් විය. පොලීසිය වහාම ඇඳිරි නීතිය පැනවී ය.

විශේෂයෙන් ම නැගෙනහිර පවත්නා ආතතීන්හි තියුනු භාවය කෙතරම් ද කිය තොත්, ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවේ ප්‍රධානි, නෝර්වේජියානු ජනරාල් ට්‍රොන්ඩ් ෆුරුහොව්දේ අඟහරුවාදා *ඇසෝෂියේටඩ් ප්‍රෙස්* ප්‍රවෘත්ති සේවයට කල අදහස් දැක්වීමක දී අනතුරු ඇඟවූයේ "සටන් විරාමය දැවැන්ත පීඩනයකට යටත්ව ඇති" බවයි. "සටන් විරාමයක් තිබුනත් යුද්ධය ඉදිරියට යයි. සටන් විරාමයක් යනු යුද්ධයේ තත්වයකි. අප ඇත්තට ම දකින්නේ එක්තරා ආකාරයක කඩාකප්පල්කාරී යුද්ධයකි." යැයි ඔහු ප්‍රකාශ කලේ ය.

එල්ටීටීඊය සතුව මෙම තත්වයට ප්‍රගතිශීලී විසඳුමක් නැත. දෙමල ඊලම් නමින් ධනපති රාජ්‍ය කැබැලිත්තක් සඳහා වූ ඔවුන්ගේ ඉල්ලීම නිරන්තරයෙන් ම නියෝජනය කලේ දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා මිස දෙමල කම්කරු පන්තියේ හා පීඩිත මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් නොවේ. දැන් එම ඉල්ලීම ලඝු කොට ඇත්තේ බලය බෙදා ගැනීමේ සම්මුතියක කනිෂ්ඨ ක්‍රියාකලාපයක් උදෙසා කොලඹ ආන්ඩුවට පීඩනය දමන ලෙස අධිරාජ්‍යවාදයට කරන නිරර්ථක ආයාචනාවන්ට ය නැත හොත් දැනටමත් ජීවිත 65,000ක් බිලි ගෙන ඇති ලේවැකි යුද්ධයක් කරා යලි ඇද වැටීමට ය.

© www.wsws.org